IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2013**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2015 මාර්තු)**

**BLE 205 - කම්කරු නීතිය**

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(6) අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.

1. සේවා ගිවිසුමක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරමින් සේවා ගිවිසුමක් (contract of service) සේවය සැපයීම සඳහා වන ගිවිසුමකින් (contract for service) වෙන් කොට හඳුනා ගැනීම සඳහා ක්‍රියාත්මක කෙරෙන නීති තත්වය නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

2. ශ්‍රී ලංකාවේ රැකියා ගිවිසුම පිළිබඳ පොදු නීතිය තුලට ව්‍යවස්ථාදායකයේ මැදිහත්වීම මගින් විශාල වෙනස්කම් හඳුන්වා දී තිබේ."

   උක්ත ප්‍රකාශය සමඟ ඔබ එකඟ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

3. වරින් වර සංශෝධිත 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනතේ සඳහන් වන සමථ කරණයෙන් ආරවුල් විසදීම යන ක්‍රමවේදයේ ස්වාභාවය, ක්‍රියාපටිපාටිය සහ එහි පවතින වාසි සහ අවාසි පිළිබඳව විග්‍රහ කරන්න.

4. (i) කාර්මික බේරුම්කරණය පිළිබඳව අප නීතිය තුළ පවතින නෛතික විධිවිධාන කවරේදැයි පහදා දෙන්න.

   (ii) ස්වේච්ජා බේරුම්කරණය සහ අනිවාර්ය බේරුම්කරණය අතර පවතින නිශ්චිත වෙනස්කම් පැහැදිළි කර කම්කරු ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් ලෙස එහි ඇති ඵලදායීතාව විමසන්න.

5. ශ්‍රම අධ්‍යාපන ආයතනයේ පැවැත්වීමට නියමිතව ඇති පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා පහත දැක්වෙන තේමාව යටතේ ශිෂ්‍ය ඔබගෙන් වර්තාවක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටියි.
   "කාර්මික සාමය ප්‍රවර්ධනය කිරීම පිණිස කම්කරු විනිශ්චය සභාවල කාර්යභාරය පිළිබඳව බරපතල ලෙස සිතා බැලීම අවශ්‍ය වී ඇත."

   උක්ත මාතෘකාව යටතේ (i) කම්කරු විනිශ්චය සභා පිහිටුවීමේ මූඛ්‍ය පරමාර්ථය, (ii) ඒවා සතු අධිකරණ පාත්‍රතාව සහ කාර්යයන් (iii) එමගින් ලබාදිය හැකි නෛතික ප්‍රතිකම් යන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔබගේ වාර්තාව ලියා දක්වන්න.

6. ශ්‍රී ලංකාව තුළ ශ්‍රම සැපයීම් සිදුකෙරෙන ප්‍රධානතම සහ සාම්ප්‍රදායික සේවා ක්ෂේත්‍ර (sectors of employment) කවරේදැයි පෙන්වා දී එක් එක් ක්ෂේත්‍ර තුළ නිරත ශ්‍රම බලකායන්හි රැකියාව සුරක්ෂිත කිරීම පිණිස හඳුන්වා දී ඇති නීති තත්ත්වයන් විස්තර කරන්න.

7. (i) රැකියාව තුළ සේවකයා විසින් සිදුකරනු ලබන විෂමාචාරයන් සේවා ගිවිසුමට කෙසේ බලපාන්නේදැයි පෙන්වා දෙන්න.

   (ii) "පරිවාසිකයාද සේවකයෙකි"
   උක්ත මතය පිළිබඳ අධිකරණයේ අවධානය කෙසේ යොමු වී ඇත්දැයි නඩු තීන්දු ඇසුරින් පෙන්වා දෙන්න."

8. ඔබ රැකියාවේ නියුතු ආයතනය තුළ නවතම වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීමට සේවක පිරිසකට අවශ්‍ය වී ඇත.

i) ඔබ ආයතනයේ විවිධ සේවා නියුක්ත ගිවිසුම් යටතේ එනම් ස්ථිර, තාවකාලික, නිශ්චිත කාලීන, අනියම් සේවකයින් සේවයේ නිරත කර ඇත.

(ii) ඔබ ආයතනයේ දැනටමත් ක්‍රියාකාරී වෘත්තීය සමිති තුනක් පිහිටුවා ඇත.

(iii) උක්ත සේවක පිරිස විසින් වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීමට දරන ප්‍රයත්නයන්ට සේවා යෝජක විසින් විරෝධතා එල්ලකරමින් සිටියි.

ඉහත අවස්ථා සැලකිල්ලට ගනිමින් නවතම වෘත්තීය සමිතිය පිහිටුවා ගැනීමට උත්සාහ දරණ සේවක පිරිසට වෘත්තීය සමිති නීතිය ඇසුරින් උපදෙස් දෙන්න.

~~~~~~
~~~~~~